# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 44 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 නොවැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 නොවැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි තැපැල් ගාස්තුව : ශත 75 යි

**1985 අංක 44 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1985 නොවැම්බර් මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 21/84.

**සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1985 අංක 44 දරන සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතෙහි (1957 අංක 60 දරන පනත මගින් ඇතුළත් කරන ලද) හා 1981 අංක 53 දරන පනතින් සංශෝධිත 18ආ වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ :— 129 වන අධිකාරයේ 18ආ වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මේ කොටස අදාළ වන ස්ත්‍රී සේවකයෙකුට දරු ප්‍රසූතියක් වුවහොත් ඇයට—

(අ) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවුවහොත් සහ ඒ සේවිකාවට, ප්‍රසූති දිනය වන විට දරුවකු නොමැති නම් හෝ එක් දරුවකු පමණක් සිටී නම් ප්‍රසූති දිනයෙන් ආරම්භව දවස් හැත්තෑවක කාලසීමාවක් සඳහා ; සහ

(ආ) (i) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහිවුවහොත් සහ ඒ සේවිකාවට ඒ ප්‍රසූති දිනය වන විට දරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටී නම් ; හෝ

(ii) ප්‍රසූතියෙන් සජීවී දරුවකු බිහි නොවුවහොත්

ප්‍රසූති දිනයෙන් ආරම්භව දවස් විසි අටක කාලසීමාවක් සඳහා නිවාඩු ලබා ගැනීමට හිමිකම ඇති අතර එසේ ඇය විසින් නිවාඩු ලබාගත යුතු ය ; තවද සේවායෝජකයා විසින් ඒ නිවාඩු ලබාදිය යුතු ය.";

(ආ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "(2) වන උපවගන්තියේ සඳහන් නිවාඩු කාලසීමාව" යන වචන වෙනුවට "(2) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් නිවාඩු කාලසීමාව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

2—ඒ 086182—8,200 (85/10)

(ඇ) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) (1) වන උපවගන්තිය යටතේ සේවායෝජකයා වෙත යවන දැන්වීමෙහි සෑම ස්ත්‍රී සේවකයකු විසින්ම, (2) වන උපවගන්තිය යටතේ ඇති නිවාඩු හිමිකම නිර්ණය කිරීමේ කාර්යය සඳහා, ඇය ප්‍රසූතිය සිදුකරන දිනය වන විට ඇයට සිටින දරුවන් සංඛ්‍යාව, නිශ්චිතව සඳහන් කළ යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.